සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**47 S I**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

ඉස්ලාම් ශිෂ්ටාචාරය I
இஸ்லாமிய நாகரிகம் I
**Islamic Civilization I**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

විභාග අංකය ..............................

**අයදුම්කරුවන්ට උපදෙස්:**

- ❊ මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** යුක්ත වේ.
- ❊ I කොටසේ **සියලු ම** ප්‍රශ්නවලටත්, II හා III කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරා ගෙන, ප්‍රශ්න **හතරකටත්** පිළිතුරු සපයන්න.
- ❊ I කොටසට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයා, II හා III කොටස්වල පිළිතුරු පත්‍ර සමඟ **එකට අමුණා භාර දෙන්න.**

## I කොටස

(ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.)

1.

- අංක **1.1** සිට **1.5** දක්වා වූ එක් එක් ප්‍රශ්නයට වඩාත් සුදුසු පිළිතුර තෝරා, එහි අංකය ඉදිරියෙහි ඇති වරහන තුළ ලියන්න.

1.1 අල්-හම්රා මාලිගය නිර්මාණය කළ රජු
(1) මුහම්මද් බින් අල්-අහ්මර් ය. (2) ඉබ්නු තුමත් ය.
(3) තුන්වන අබ්දුර් රහ්මාන් ය. (4) අබුල් වලීද් බින් ජව්හර් ය. (............)

1.2 අකබා ගිවිසුමෙන් පසු ඉස්ලාමය දේශනා කිරීමට නබිතුමා විසින් මදීනාවට යැවූ සහාබා වතුයේ
(1) අබ්දුල් රහ්මාන් බින් අව්ෆ් (රලි) ය. (2) මුස් අබ්බින් උමයිර් (රලි) ය.
(3) අබුමූසා අල් අෂ්අරි (රලි) ය. (4) සඃද්බින් අබී වක්කාස් (රලි) ය. (............)

1.3 'මුස්ලිම් නේෂන්' යන පුවත්පත ආරම්භ කළ තැනැත්තා
(1) මාප්පිලෙයි ලෙබ්බේ ආලිම් ය. (2) ඒ. එම්. වාප්පිච්චි මරික්කාර් ය.
(3) සිද්දිලෙබ්බේ විද්වතා ය. (4) අයි. එල්. එම්. අබ්දුල් අසීස් ය. (............)

1.4 අබුජහ්ල් ඝාතනය වූ අරගලය
(1) උහද් නම් වේ. (2) තක්ලා නම් වේ.
(3) අහ්සාබ් නම් වේ. (4) බද්ර් නම් වේ. (............)

1.5 මධ්‍යම ආසියාතික ප්‍රදේශ ජයග්‍රහණය කළ සෙන්පතිවරයා
(1) මුහම්මද් බින් කාසිම් ය. (2) තාරික් බින් සියාද් ය.
(3) කුතෛබා බින් මුස්ලිම් ය. (4) මස්ලමා ය. (............)

- අංක **1.6** සිට **1.10** දක්වා වූ වාක්‍ය සඳහා වඩාත් සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

1.6 මාප්පිලෙයි ලෙබ්බේ ආලිම් විසින් ශ්‍රී ලංකාවේ පවත්වාගෙන ගිය සූෆි තරීකා .......................................... ලෙස හැඳින්වේ.

1.7 .......................................... තුමා අබුසර් අල් කිෆ්ෆාරි (රලි) රටින් පිටුවහල් කළ බවට චෝදනා ලැබී ය.

[ දෙවෙනි පිටුව බලන්න.

1.8 කෑබාහි එල්ලා තිබූ ප්‍රධාන කවි හත ............................................ ලෙස හැඳින්වේ.

1.9 කරාජ් බද්ද ...................................... ලෙස සිංහල බසින් දක්විය හැකි ය.

1.10 ශ්‍රී ලංකාවේ ජාතික කොංග්‍රසයේ උපසභාපති ලෙස මුස්ලිම් සමාජයේ කෙනෙකු වන ...................................... තුමා කටයුතු කළේ ය.

- අංක **1.11** සිට **1.15** දක්වා වූ එක් එක් ප්‍රකාශය නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (X) ලකුණ ද, ඉදිරියෙහි ඇති වරහන තුළ යොදන්න.

1.11 'දීවානුත් තඖකාත්' යනු වියදම් දෙපාර්තමේන්තුව වේ. (............)

1.12 අබූ මුස්ලිම් කුරාසානි කලීෆා අබූ ජඃෆර් අල් මන්සූර්ගේ පාලන සමයේ දී ඝාතනය විය. (............)

1.13 කලීෆා අබ්දුල් මලික්ගේ පාලන සමයේ උමර්බින් අබ්දුල් අසීස් (රහ්) මදීනාහි අණ්ඩුකාරවරයා විය. (............)

1.14 අල්ප්-අර්සලාන් සෙල්ජුක් සුළු රාජ්‍ය පාලකයින්ගෙන් කෙනෙකි. (............)

1.15 නබි මුහම්මද් (සල්) තුමාගේ වාණිජ කටයුතු ගැන දැනගැනීමට කදීජා (රලි) විසින් පත්කොට තිබූ තැනැත්තිය මයිසරා නම් වේ. (............)

- අංක **1.16** සිට **1.20** දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

1.16 මුඃතසිලා ප්‍රතිපත්තිය රාජ්‍ය ප්‍රතිපත්තියක් ලෙස ප්‍රකාශයට පත් කළ අබ්බාසි කලීෆා කවුද?

..............................................................................................................

1.17 හුදෙබියා ගිවිසුමෙන් සහාබාවරුන් අතර නොසන්සුන්කමක් පැන නැගුණු විට කුර්බාන් ඉටුකර හිසකෙස් ඉවත් කිරීමේ කටයුත්ත පළමුව ආරම්භ කරන ලෙස නබිතුමාට උපදෙස් දුන්, නබිතුමාගේ භාර්යාවගේ නම කුමක් ද?

..............................................................................................................

1.18 පර්සියානු අධිරාජ්‍යයේ ඉරණම තීරණය කිරීමට බලපෑ මුස්ලිම්වරුන් සහ පර්සියානුවන් අතර සිදු වූ යුද්ධය කුමක් ද?

..............................................................................................................

1.19 නූර්දීන් zසංගි ස්ථාපිත කළ ඉහළ අධිකරණය කුමන නමකින් හැඳින්වූයේ ද?

..............................................................................................................

1.20 කොන්ස්තන්තිනෝපලය අල්ලා ගත් කලීෆාගේ නම කුමක් ද?

..............................................................................................................

**

[ තුන්වෙනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**47 S I**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

**ඉස්ලාම් ශිෂ්ටාචාරය I**
**இஸ்லாமிய நாகரிகம் I**
**Islamic Civilization I**

* II සහ III කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරා ගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## II කොටස

(ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න.)

2. අකබා ගිවිසුම හා සම්බන්ධ කොට පහත මාතෘකා යටතේ පිළිතුරු සපයන්න.
   (අ) අකබා ගිවිසුම සිදු වූ පසුබිම
   (ආ) අකබා ගිවිසුමේ අන්තර්ගත වූ කොන්දේසි
   (ඉ) ගිවිසුමේ අරමුණ
   (ඊ) ගිවිසුමේ ප්‍රතිවිපාක

3. කලීෆා අලි (රලි) ගැන පහත මාතෘකා යටතේ පැහැදිලි කරන්න.
   (අ) කලීෆා පදවිප්‍රාප්ත වීම
   (ආ) රට තුළ සිදු වූ කැරලිවලට හේතු
   (ඉ) රට තුළ සිදු වූ කැරලි මැඩලීමට ගත් ක්‍රියාමාර්ග
   (ඊ) කලීෆා පිළිබඳ ඔබේ ඇගයීම

4. ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ගේ ඉතිහාසයට සම්බන්ධ කොට පහත මාතෘකා පැහැදිලි කරන්න.
   (අ) අරාබිවරුන් හා ශ්‍රී ලාංකිකයන් අතර සබඳතාව
   (ආ) මුල් ජනාවාස
   (ඉ) සිංහල රජවරුන් හා පැවති සබඳතාව
   (ඊ) නිදහසින් පසු දේශපාලන ක්ෂේත්‍රයට සිදු වූ දායකත්වය

5. කලීෆා වලීද් බින් අබ්දුල් මලික් ගැන පහත මාතෘකා යටතේ සටහන් ලියන්න.
   (අ) කලීෆා ලෙස පදවිප්‍රාප්ත වූ පසුබිම
   (ආ) රාජ්‍ය ප්‍රසාරණය
   (ඉ) ඔහුගේ ප්‍රාදේශීය ආණ්ඩුකාරවරු
   (ඊ) කලීෆා පිළිබඳ ඔබේ ඇගයීම

## III කොටස

(ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න.)

6. නබි මුහම්මද් (සල්) තුමාගේ හජ්ජතුල්විද දේශනයේ අන්තර්ගත අංග කෙටියෙන් සඳහන් කර, එම දේශනයේ වැදගත්කම පහද දෙන්න.

7. ෆාතිමි කුඩා රාජ්‍යයේ බිහි වීම සහ දායකත්වය ගැන සාකච්ඡා කරන්න.

8. අබ්බාසි කිලාෆතයේ බිඳවැටීමට හේතු වූ සාධක මොනවා ද'යි පැහැදිලි කරන්න.

9. කලීෆා හාරූන් අල් රෂීද්ගේ පාලනයේ යහපතට බර්මකීවරුන් ඉටු කළ සේවාවන් ගැන පැහැදිලි කොට, ඔවුන්ගේ බිඳවැටීමට හේතු වූ සාධක පැහැදිලි කරන්න.

***

**AL/2010/47-S-II**

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**47 | S | II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

ඉස්ලාම් ශිෂ්ටාචාරය II
இஸ்லாமிய நாகரிகம் II
Islamic Civilization II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

විභාග අංකය ..............................

**අයදුම්කරුවන්ට උපදෙස්:**

※ මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** යුක්ත වේ.

※ I කොටසේ **සියලු ම** ප්‍රශ්නවලටත්, II හා III කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරා ගෙන, ප්‍රශ්න **හතරකටත්** පිළිතුරු සපයන්න.

※ I කොටසට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයා, එය II හා III කොටස්වල පිළිතුරු පත්‍ර සමඟ **එකට අමුණා භාර දෙන්න.**

## I කොටස

(ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.)

**1.**

● අංක **1.1** සිට **1.5** දක්වා වූ එක් එක් ප්‍රශ්නයට වඩාත් සුදුසු පිළිතුර තෝරා, එහි අංකය ඉදිරියෙහි ඇති වරහන තුළ ලියන්න.

1.1 නබි (සල්) තුමා තමාගේ අවසාන රමළාන්හි දී කුර්ආනය සම්පූර්ණයෙන් පාරායනය කිරීම අසා සිටි ප්‍රසිද්ධ සහාබා වනුයේ
(1) අබ්දුල්ලා බින් මස්ඌද් (රළි) ය.
(2) අබ්දුල්ලා බින් අබ්බාස් (රළි) ය.
(3) Zසයිදුබින් සාබිත් (රළි) ය.
(4) Zසයිදුබින් හාරිස් (රළි) ය. (...........)

1.2 ඉබ්නුල් මාලික් ලියූ අහ්කාම් අල් කුර්ආන් යන තෆ්සීර් අවධානය යොමු කර විග්‍රහ කරන ක්ෂේත්‍රය
(1) නබිතුමාගේ ඉතිහාසය ය.
(2) තව්හීද් සංකල්පය ය.
(3) කුර්ආන්හි සඳහන් ව්‍යාකරණ හා සාහිත්‍යය සම්ප්‍රදාය ය.
(4) කුර්ආන්හි නීති ය. (...........)

1.3 ඉබ්නු හයිදම් රචනා කළ වෛද්‍ය ග්‍රන්ථය වනුයේ
(1) කිතාබ් අත්තස්රීෆ් ය. (2) කිතාබ් අල් මනාළිර් ය.
(3) අල් හාවී ය. (4) කානූන් ෆිත්තිබ් ය. (...........)

1.4 කුතුබ් මිනාරය ඉදි කළ පාලකයා
(1) අබ්දුල් මලික් බින් මර්වාන් ය.
(2) කුතුබුද්දීන් අල් අයිබක් ය.
(3) සුල්තාන් සලාහුද්දීන් ය.
(4) හාරූන් අල් රෂීද් ය. (...........)

1.5 නිදහස්ව සිතා තවත් අයෙකුගේ උදව් රහිතව නීති ලබා ගත හැකි අය
(1) මුජ්තහිද් මුන්තසිබ් ය. (2) මුජ්තහිද් මස්හබ් ය.
(3) මුජ්තහිද් මසාඉල් ය. (4) මුජ්තහිද් මුත්ලක් ය. (...........)

- අංක **1.6** සිට **1.10** දක්වා වූ වාක්‍ය සඳහා වඩාත් සුදුසු වචන යොද හිස්තැන් පුරවන්න.

1.6 හිරා ගුහාවේ දී පහළ කරන ලද ආයත් පහෙන් යුත් 'අලක්' ෂූරාව උස්මාන් (රලි) සමයේ සංග්‍රහ කළ කුර්-ආනයේ ........................................ වන ෂූරා ලෙස පවතී.

1.7 තව්හීද් සංකල්පය පැහැදිලිව විස්තර කිරීමට එය තව්හීද් අර්රුබූබියියා, තව්හීද් අල් උලූහියියා සහ ........................................ යන කොටස් තුනකට වර්ගීකරණය කර ඇත.

1.8 උමර් කයියාම් සකස් කළ කැලැන්ඩරයට ........................................ ජලාලියියා යන නම යොද ඇත.

1.9 වඩාත් පැහැදිලිව ඇති ........................................ යන ආයත්වල ඇති නීතිවල නස්කු අනුමත නොකෙරේ.

1.10 අZස්රකියියා, නජ්දියියා, ඉබාදියියා යන කණ්ඩායම් ........................................ ට අයත් අය වේ.

- අංක **1.11** සිට **1.15** දක්වා වූ එක් එක් ප්‍රකාශය නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියෙහි ඇති වරහන තුළ යොදන්න.

1.11 ඉල්ම් අල් ජරහ් වත්තඃදිල් යනු රාවිගේ සුදුසුකම් සහ ඔහු රිවායත් කළ හදීස්වල විශ්වාසනීයභාවය සඳහන් කරයි. (............)

1.12 අහ්ලුල් බෛත් රිවායත් කළ හදීස් පමණක් ෂියාවරු පිළිගනිති. (............)

1.13 මෙලොව ජීවිතයේ ආශාවන් තුරන් කිරීමෙන් පමණක් පරලොව ජීවිතයේ විමෝක්ෂය ලැබේ ය'යි ඉස්ලාම් අවධාරණය කරයි. (............)

1.14 අරාබි දේශයෙන් පිටත අරාබිවරු ඉඩම් මිල දී නොගත යුතු යැ'යි උස්මාන් (රලි) නියෝග කළේ ය. (............)

1.15 ඉස්ලාම් ලබා දී ඇති මානව හිමිකම් ක්‍රියාත්මක කිරීමේ දී ඉස්ලාම් රාජ්‍යයන් තම රටවැසියන් මුස්ලිම්වරු හා මුස්ලිම් නොවන අය ලෙස වෙන් නොකරයි. (............)

- අංක **1.16** සිට **1.20** දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

1.16 'අක්ලාම් අස්සිත්තා' යන ලේඛන කලාව හඳුන්වා දුන් විද්වතාගේ නම සඳහන් කරන්න.

........................................................................................................

1.17 මුහම්මද් ඉබ්නු ඉබ්රාහීම් අල් ෆසාරි අරාබි භාෂාවට පරිවර්තනය කළ සංස්කෘත ග්‍රන්ථයේ නම කුමක් ද?

........................................................................................................

1.18 ඉල්යාස් (රහ්) තබ්ලීක් සංවිධානය බිහි කළ ස්ථානයේ නම කුමක් ද?

........................................................................................................

1.19 රාවිවරුන් පිළිබඳ විස්තර ඇතුළත් 'තාරික් අල් කබීර්' යන ග්‍රන්ථයේ ලේඛකයාගේ නම සඳහන් කරන්න.

........................................................................................................

1.20 අගමැති නිසාමුල් මුල්ක් නිර්මාණය කළ විශ්ව විද්‍යාලයේ නම සඳහන් කරන්න.

........................................................................................................

**

[ තුන්වෙනි පිටුව බලන්න.

මෙතැනින් කපන්න

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

47 S II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

ඉස්ලාම් ශිෂ්ටාචාරය II
இஸ்லாமிய நாகரிகம் II
Islamic Civilization II

* II සහ III කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරා ගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## II කොටස

(ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න.)

**2.** ජාහිලියියා සමාජයෙන් නබි (සල්) තුමා බිහි කළ සමාජය වෙනස් වන ආකාරය පිළිබඳව පහත මාතෘකා යටතේ ලියන්න.

(අ) දේව විශ්වාසය
(ආ) විවාහ ක්‍රමය
(ඉ) හජ් වන්දනාව
(ඊ) ස්ත්‍රී අයිතිවාසිකම්

**3.** අරාබි ඉතිහාස කලාව පිළිබඳ පහත මාතෘකා යටතේ ලියන්න.

(අ) මුස්ලිම්වරු ඉතිහාසය ඉගෙනීමට දිරිගැන්වූ සාධක
(ආ) ඉස්ලාමීය සමයේ ඉතිහාසය ලිවීමට ආධාර වූ මූලාශ්‍ර
(ඉ) ප්‍රසිද්ධ ඉතිහාසඥයන් **හතර දෙනකුගේ** නම් සඳහන් කොට, ඔවුන් එකිනෙකා විසින් රචිත ග්‍රන්ථවල නම් සඳහන් කරන්න.
(ඊ) ඉස්ලාමීය ඉතිහාස කලාවේ විශේෂ ලක්ෂණ

**4.** ඉස්ලාම්හි දේශපාලන චින්තන ගැන පහත මාතෘකා යටතේ ලියන්න.

(අ) කිලාෆත් සංකල්පය
(ආ) දේශපාලනයට මජ්ලිස් ෂූරාහි දායකත්වය
(ඉ) ඉස්ලාම් දේශපාලන සංකල්පයේ නීති සම්පාදන බලය
(ඊ) බටහිර ප්‍රජාතන්ත්‍රවාදී පාලනයත් කිලාෆතයත් අතර වූ සමාන අසමානකම්

**5.** ඉස්ලාමීය ප්‍රතිසංස්කරණ පිළිබඳ පහත මාතෘකා යටතේ ලියන්න.

(අ) ඉස්ලාමීය ප්‍රතිසංස්කරණය යන්නෙහි අර්ථය
(ආ) ඉස්ලාමීය සමාජයේ ප්‍රතිසංස්කරණයක් සිදු කළ යුතු යැ'යි අදහස් කරන ප්‍රධාන ක්ෂේත්‍ර
(ඉ) ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට සම්බන්ධ වී ඇති ශ්‍රී ලංකාවේ සංවිධානයක කාර්යයන්
(ඊ) ඔබ ජීවත් වන ප්‍රදේශයට විශේෂ අවධානය යොමු කරමින් ආගමික ප්‍රතිසංස්කරණයක් සිදුවිය යුතු යැ'යි සිතන අංශ **දෙකක්**

## III කොටස

(ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න.)

**6.** 'මිනිසුන් සියලු දෙනා ම සමාන වේ' යන ඉස්ලාමීය සංකල්පය පැහැදිලි කොට, මෙම සමානතා සංකල්පය මුස්ලිම් ස්ත්‍රීන් කෙරෙහි ද ක්‍රියාත්මක වේ ද'යි විශ්ලේෂණය කරන්න.

**7.** වෛද්‍ය විද්‍යා ක්ෂේත්‍රයේ වර්ධනයට මුස්ලිම්වරුන් විසින් ඉටු කළ කාර්යභාරය පහදන්න.

**8.** තසව්වුෆ් කලාවේ බිහි වීම, වර්ධනය සහ එය සමාජයේ ඇති කළ බලපෑම් ගැන විස්තර කරන්න.

**9.** ඉමාම් ෂාෆි (රහ්) තුමා, ෆික්හ් ක්ෂේත්‍රයට සිදු කළ දායකත්වය ගැන විස්තර කරන්න.

***